# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,230 - 2021 මැයි මස 28 වැනි සිකුරාදා - 2021.05.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1266 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1267 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1268 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1270 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ජූනි මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූනි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - මඩකලපුව**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවලදී රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2021.06.05 වැනි දින පෙරවරු 9.00 ට මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට නියමිතය.

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී භාණ්ඩ ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳ කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසිය සිදු කරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මඩකලපුව.

2021 මැයි මස 12 වැනි දින.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය**

| අංකය | නඩු අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ | අයිතම ගණන |
|---|---|---|---|---|
| 1. | 63377/E/20 | EP AAZ - 9998 | ත්‍රීරෝද රථය | 01 |
| 2. | 48700/ MT/17 | EP BBX - 5746 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 3. | 50772/ E/18 | EP BDK - 6293 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 4. | 57309/ PC/19 | EP BAQ - 1836 | යතුරු පැදිය | 01 |
| 5. | 61907/ MT/20 | EP BFL - 8066 | යතුරු පැදිය | 01 |
| 6. | 62154/ MT/20 | EP HS - 8070 | යතුරු පැදිය | 01 |
| 7. | 62408/ MT/20 | EP GX - 8347 | යතුරු පැදිය | 01 |
| 8. | 38983/ PC/16 | | සිලින්ඩරය | 01 |
| 9. | 63455/S/21 | | සවල් | 01 |
| 10. | 63287/ S/21 | | සවල් | 01 |
| 11. | 63288/ S/21 | | සවල් | 01 |
| 12. | 63290 / S/21 | | සවල් | 01 |
| 13. | 63415/ S/21 | | සවල් | 01 |
| 14. | 63339/ S/21 | | සවල් | 02 |
| 15. | 62481/ S/21 | | සවල් | 01 |
| 16. | 63342/ S/21 | | සවල් | 02 |
| 17. | AR/216/21 | | යකඩ පයිප්ප | 05 |

05-469

---

වෙන්දේසිය අත්හිටුවීමයි

**කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණය**

2021.05.13 දින පළ වූ අංක 2228 ගැසට් පත්‍රයේ 05-307 යටතේ පළ වූ නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම දැනට දිවයින තුළ උද්ගතව ඇති කොවිඩ් 19 වසංගත තත්ත්වය හා පනවා ඇති සංචරණ සීමා හේතු කොට ගෙන 2021.05.29 වැනි දින නොපැවැත්වෙන බව බව නිවේදනය කරනු ලැබේ.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කුලියාපිටිය.

2021.05.28 දින.
05-481

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

කෝට්ටමුනේ TT-2 රා තැබෑරුම් රේන්ද විකිණීම

**2021 ජූලි 2022 ජූනි**

1982.08.20 වන දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝට්ටමුනේ රා තැබෑරුම් 2021 ජූලි මස 01 වැනි දින සිට 2022 ජුනි මස 30 වන දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී බාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා සහභාගී විය යුතුයි.

1. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් පන්සීයක (රු.500) මුදල මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් නමින් මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත සහ වටිනාකම් සහතිකය ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත්‍රය ලබා ගත හැක. ටෙන්ඩර් පත සමග රිසිට්පත අමුණා තිබිය යුතුයි. ටෙන්ඩර්පත නිකුත් කරනු ලබන්නේ 2021.06.01 වන දින සිට 2021.06.10 වන දින පෙරවරු 10.00 දක්වා

2. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතිකය ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතුයි. මෙම වටිනාකම් සහතිකයේ මුල්පිටපත ටෙන්ඩර්පත්‍ර සමග අමුණා තිබිය යුතු අතර මෙම වටිනාකම් සහතිකය සමග ඉඩම් රෙජිස්ට්‍රාර්තුමා විසින් ලබාදෙන ඉඩම් ලේඛන සටහන් ලසු පිටපත් අමුණා තිබිය යුතුයි. (මෙම ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පටන් ගත් දිනයෙන් පසුව ලබාගත යුතුයි.)

3. ටෙන්ඩර්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරය තුළ ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල පිටපත තම ලිපි කවරය තුළ බහා එම කවරය අලවා ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් ඉහත 2 වැනි සටහන අනුව ලේඛනය අමුණා නොමැති නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර, ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍යනම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් තුළ ඔබ ලබා ගත් ටෙන්ඩර් පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

6. තැබෑරුම් දැනට පවත්වන ස්ථානයේ දී ඉදිරි කාලයේ අඛණ්ඩව තිබේ දැයි සහතික කළ නොහැක.

7. ලියාපදිංචි කළ පොල් හා තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම්, සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර, දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව හා රා තැබෑරුම් බදු ගෙවා පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 අංක හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතුයි.)

8. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

වී. වාසුදේවන්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මන්මුනේ උතුර, මඩකලපුව.

**රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය**

| *රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| මඩකලපුව මහනගර සභා මායිම් තුළ | TT2 | 2021.06.10 | පෙරවරු 10.00 |

*සටහන.-*

01. ටෙන්ඩර් මණ්ඩලය 2021.06.10 වන දින පෙරවරු 10.00 ට රැස්වේ.

02. විකුණුම් දින සුදුසු බදුකරු තෝරානොගතහොත් නැවත විකිණීම 2021.06.21 වන දින පෙරවරු 10.00 ට රැස්වේ.

05-455

# රජයේ නොවන දැන්වීම්

## පැනෝස් ඉන්ස්ටිටියුට් සවුත් ඒෂියා

සමාගම් ලියාපදිංචි අංකය GA 77

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ සමාගමේ ඇවරකරු පත්කිරීමේ දැන්වීම

කොළඹ 04, කාසල් පටුමගේ අංක 11 හි තුන්වන මහලෙහි පදිංචි ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් වන මා 2021 අප්‍රේල් මස 30 වැනි දින කොළඹ 03, Galle Fac Court 2, නො. 40 දරන ස්ථානයේ පිහිටි පැනෝස් ඉන්ස්ටිටියුට් සවුත් ඒෂියාහි පැවති විශේෂ මහා සභා රැස්වීමේ සාමාන්‍ය යෝජනා සම්මතයෙන් එම සමාගමේ ඇවරකරු වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්,
ඇවරකරු
පැනෝස් ඉන්ස්ටිටියුට් සවුත් ඒෂියා.

2021 මැයි මස 29 වැනි දින,
3 වන මහල, අංක 11,
කාසල් පටුමග,
කොළඹ 04

05-434

---

## බ්‍රිට් ලැන්ජ් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය N (PVS) 17369

සමාගම පරිවෘත කිරීමේ සහ ඇවරකරුවන් නිදහස් කිරීමේ දැන්වීම

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | බ්‍රිට් ලැන්ජ් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 253/31, අකුරෙගොඩ පාර, තලංගම දකුණ, පැලවත්ත, බත්තරමුල්ල |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | HC (සිවිල්) 8/2007/CO |
| ඇවරකරුවන්ගේ නම් | : | පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | 4 වන මහල, අංක 02 (දැනට 3 වන මහල, අංක 11) කාසල් පටුමග, කොළඹ 04 |
| සමාගම පරිවෘත කිරීමේ සහ ඇවරකරුවන් නිදහස් කිරීමේ දිනය | : | 2021.03.30 |

05-435

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ තත්ත්වය වෙනස් කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : ග්ලවුස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 1017
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : පල්ලෙගොඩවත්ත කර්මාන්ත ගම්මානය, මීරිගම පාර, මතුගම
සමාගමේ අළුත් නම : ග්ලවුස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්

ග්ලවුස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සඳහා සහ වෙනුවෙන්.

ක්‍රෙස්ටන් කෝර්පරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2021 මැයි මස 10 වැනි දින.

05-438

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : කොලස්ටෝන්ස් කොන්සොලිඩේටඩ් (පී.වී.ටී.) එල්. ටී. ඩී.
ලියාපදිංචි අංකය : පීවී 00239428
ලියාපදිංචි කළ දිනය : 2021.05.10
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 15 A, සේනානායක පෙදෙස, දෙහිවල.

සමාගම් ලේකම්.

05-447

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ලයිට් කෝඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00236555
ලියාපදිංචි ලිපිනය : අංක 11/7, පළමුවන පටුමග, විජය මාවත, මිනුවන්ගොඩ.

සමාගම් ලේකම්.

05-449

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඩයිමෙන්සන්ස් ගේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00236480
ලියාපදිංචි ලිපිනය : අංක 11/7, පළමුවන පටුමග, විජය මාවත, මිනුවන්ගොඩ.

සමාගම් ලේකම්.

05-451

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ''ෆයිව් ඩී'' ෆ්‍රීඩම් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00237797
ලියාපදිංචි ලිපිනය : අංක 11/7, පළමුවන පටුමග, විජය මාවත, මිනුවන්ගොඩ.

සමාගම් ලේකම්.

05-450

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

තෙල්ලිප්පාලයි දැනට No. 17 Rue Prosper Legoute 92160A Atony Paries, France ලිපිනයෙහි පදිංචි රාජරත්නම් බාස්කරන් සහ ඔහුගේ බිරිඳ කමලාජිනිදේවි යන දෙදෙනා වන අපි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා එහි ජනතාවට කියා සිටින්නේ තෙල්ලිප්පාලයි, විමන්කමම් උතුර, පාලයි ලිපිනයේ පදිංචි නල්ලයියා රාජේන්ද්‍රම් යන අය ඇටෝර්නි බලකරුවකු ලෙස පත්කරමින් No. 92, Mairie D' Atton France හි පදිංචි මලිකා ලුඩාර්නි Adjoint Administratif විසින් ලියා සහතික කළ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ වෙලුම 107 පත්ඉරුව 70 දිනපොත් අංකය 4502 යටතේ ලියාපදිංචි කර ඇති 2017.12.07 දිනැති ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යක්ෂ කොට බලරහිත කරනු ලැබ ඇත.

රාජරත්නම් බාස්කරන් සහ බිරිඳ
කමලාජිනිදේවි.

05-452

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හබුරුගල, දෙද්දුව, අංක 127 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 561571341 A හිමි (01) සුනිල් ආනන්ද රණවක වන මම ද, ඉදුරුව, අතුරුවැල්ල ''රණගිරි'' හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 573161661 V හිමි (02) කමල් ධම්මානන්ද රණවක වන මම ද, ඉදුරුව අතුරුවැල්ල හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 615892483 V හිමි (03) දීප්ති මල්ලිකා රණවක වන මම ද, ඉදුරුව, අතුරුවැල්ල හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 670202771 V හිමි (04) සුසිල් ලීලානන්ද රණවක වන මම ද වන අප හතර දෙනාට හබුරුගල පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් චතුරානි අබේවික්‍රම මහත්මිය විසින් ලියා සහතික කර දෙන ලද අංක 3947 සහ වර්ෂ 2019.04.25 දින දරන ගාල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දරන පොත් අංක 1286 යටතේ 103 කාණ්ඩයේ 58 පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් බෙන්තොට, කෝම්මල, අංක 175 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 831940875 V හිමි ගයාන් ක්‍රිෂාන්ත සිරිමාන්න යන අයට දෙන ලද ඇටෝර්නි බලය මෙතැන් සිට ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බවත් මින් ඉදිරියට ඔහු විසින් අප වෙනුවෙන් කරනු ලබන කිසිම කාර්යයකට ගනුදෙනුවකට අප වග නොකියන බවත් මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමු.

01. සුනිල් ආනන්ද රණවක
02. කමල් ධම්මානන්ද රණවක
03. දීප්ති මල්ලිකා රණවක
04. සුසිල් ලීලානන්ද රණවක

2021 මැයි මස 19 වැනි දින.

05-479

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හොරණ, ශ්‍රී සීලරතන මාවත, නො. 95 හි පදිංචිව සිට දැනට 09, EXELL DRIVE DANDENONG NORTH 3578, VIC, MELBOURN, AUSTRALIA දරන ස්ථානයේ පදිංචි හල්පන්දෙනිය හේවගේ දීප්ති කුමාර ආනන්දවංශ වන මා විසින් ඕස්ට්‍රේලියාවේ දී ලියා සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය Special Power of Attorney dated 12th January, 2015 attested by Wimalasiri Jayakody 26 Thomas Mitchell Drive, Endeavour Hills, Vic 3802 Registered in the Register of Written Auhorities in Volume/Folio 155/45 day Book entry No. 554 dated 28 th January, 2015 මෙතැන් පටන් අවලංගු හා බලරහිත ශූන්‍ය ලේඛනයක් බව මෙයින් සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස දන්වන අතර එකී බලපත්‍රය යටතේ මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් අංක 68, ශ්‍රී සීලරතන මාවත, හොරණ හි පදිංචි හල්පන්දෙනිය හේවගේ ගාමිණී කීර්ති කුමාර ආනන්දවංශ (ජා. හැ. අංකය 620570656 වී) අය අයට දී ඇත්තාවූ 2015.01.12 වැනි දින ඇටෝර්නි බලය මෙතැන් පටන් මින් අවලංගු කරන්නෙමි. එබැවින් අද දින පටන් එකී ඇටෝර්නි බලකරු විසින් කරන කිසිදු කටයුත්තකට හල්පන්දෙනිය හේවගේ දීප්ති කුමාර ආනන්දවංශ වන මා මින්මතු වග නොකියන බව මෙයින් සියලු දෙනාට ම දැනුම් දෙමි.

හල්පන්දෙනිය හේවගේ දීප්ති කුමාර ආනන්දවංශ.

05-480

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එච්. ආර්. කේ. ඩබ්ලිව්. කේ. කුමාර සහ එච්. ආර්. කේ. විපුලසේන.
ගිණුම් අංක : 0060 5000 9538.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.10.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැත්තෑ දෙලක්ෂ හැත්තෑ තුන් දහස් තුන්සිය දහයයි ශත හැට නවයක (රු. 17,273,310.69) මුදල ද, 2020 සැප්තැම්බර් මස 11 වැනි දින සිට අංක 354 සහ 1575 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි පනස් පන් ලක්ෂයක (රු. 15,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.13 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.11.13 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.07.09 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්යේ, බුත්තල කෝරළේ, කතරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කඳසුරිඳුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දෙටගමුව ග්‍රාමයේ පිහිටි ''දෙටගමුවේ හේන '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්නරාජා යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් 31 දාතම හා අංක 2015-332 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පාර සහ EPTP 25හි ලොට් 679, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : EPTP 25හි ලොට් 661, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2015-332 දරන එකී පිඹුරට අනුව ය.

එකී ලොට් A පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි:

එකී දෙටගමුව ග්‍රාමයේ පිහිටි ''දෙටගමුවේ හේන'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී. අත්තනායක යන අය විසින් සාදන ලද 2005 සැප්තැම්බර් මස 12 දතම හා අංක M 805 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සහ EPTP 25හි ලොට් 679, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : EPTP 25හි ලොට් 661, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක M805 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO/N 06/115 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-461

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩී. එස් ඒ. ආරියපාල සහ ආර්. රියාල්.
ගිණුම් අංක : 1096 5461 6319.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2021.01.27 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අනූ තුන් ලක්ෂ පනස් දහස් හත්සිය

පනහයි ශත පනස් දෙකක (රු. 9,350,750.52) මුදල ද, 2021 ජනවාරි මස 19 වැනි දින සිට 2040 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ දෙලක්ෂ තිස් නම දහස් දෙසිය පනහයි ශත එකක (රු. 8,239,250.01) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයයි දශම පහයි බිංදුවක් (9.50%) හා තවත් රුපියල් එක්කෝටි අසූ අට ලක්ෂයක (රු. 188,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් දෙලක්ෂයක (රු. 200,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.04.23 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2021.04.30 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.06.28 වැනි දින ප. ව. 12.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ. රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, හැඳළ-දකුණ අංක 172C දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හැඳළ පිහිටි "දවටගහවත්ත සහ දවටගහමල් කුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ඩී. සී. ඒ. පෙරේරා යන අය විසින් සාදන ලද 2014 පෙබරවාරි මස 13 (වඩා නිවැරදිව 2014 අගෝස්තු මස 8) දාතම හා අංක 5046A (වඩා නිවැරදිව 5046B) දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ කොටසක්, නැගෙනහිරට : ආර්. රියාල් විසින් හිමිකම් කියන ඉඩම (වඩා නිවැරදිව ඇළ), දකුණට : ඩබලිව්. උඩුගම්පොලගේ ඉඩම අංක 1199 දරන පිඹුරේ ලොට් 7-පාර, බස්නාහිරට : අංක 1199 දරන පිඹුරේ ලොට් 7 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහයි හතක් (A: 0, R : 0, P : 12.57) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5046A (වඩා නිවැරදිව 5046B) දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1A පහතින් විස්තර කොට ඇති ඉඩමේ උප බෙදුමක් වේ :

එකී හැඳළ පිහිටි "දවටගහවත්ත සහ දවටගහමල් කුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ජේ. ද සිල්වා යන අය විසින් සාදන ලද 1983 පෙබරවාරි මස 13 දාතම හා අංක 1199 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : ඇළ, ගිණිකොනට : ලොට් 4, 6, 7 සහ පාර, නිරිතට : ලොට් 7 (මාර්ග වෙන්කිරීම), ලොට් 2 සහ බස්නාහිරට : ඇළ සහ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම එකයි පහක් (A: 0, R : 0, P : 14.15) විශාල ඉඩම් කොටස සමග එකී අංක 1199 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 738/98 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 1199 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 6 සහ 7 දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද ඒ හා බැඳුනු වෙනත් අයිතීන්ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-462

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. ඩී. පී. පෙරේරා සහ කේ. ආර්. ටී. එන්. පෙරේරා.
ගිණුම් අංක : 0021 5004 4785.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිහත් කෝටි අසූ පන්ලක්ෂ පනස්හතර දහස් හයසිය හයයි ශත හැත්තෑ හතරක (රු. 278,554,606.74) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 1211 සහ 1273 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක (රු. 15,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක (16.5%) හා තවත් රුපියල් විසිතුන් කෝටි එකොළොස් ලක්ෂ අනූඅට දහස් දොළහයි ශත විසි අටක (රු. 231,198,012.28) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate (Quarterly) + Four Per centum (4%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට

සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.11.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.06.30 වැනි දින දහවල් 12.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැන්ද කෝරළේ, මිහින්තලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කුරුන්දකුළම අංක 574 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කුරුන්දකුළම ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන එන්. බී. ඒකනායක යන අය විසින් සාදන ලද 2012 මැයි 06 දතම හා අංක 828 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සඳහා වෙන් කිරීම, නැගෙනහිරට : ලොට් 34හි ඉඩම, දකුණට : ලොට් 42හි ඉඩම සහ බස්නාහිරට : පාර සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 828 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO E12/56 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-464/1

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

කේ. ඩී. පී. පෙරේරා, එස්. එම්. පී. රූපසිංහ, ජේ. එම්. ඩී. ටී. ආර්. සෙල්සියා නොහොත් ජේ. එම්. ඩී. ටී. රාණි සහ එන්. ටී. පී. රූපසිංහ නොහොත් එන්. රූපසිංහ.
ගිණුම් අංක : 1021 5478 2002.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි තිස්හය ලක්ෂ හැටහය දහස් දෙසිය විසි තුනයි ශත හැට පහක (රු. 13,666,223.65) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 401 සහ 968 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් පනස් ලක්ෂ විසි හතර දහස් තුන්සිය අනූවයි ශත හැට හයක (රු. 5,024,390.66) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් හතලිස් නම ලක්ෂ හතලිස් නම දහස් හයසිය පනස් හතරයි ශත පනස් හතරක (රු. 4,949,654.54) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) හා තවත් රුපියල් විසිහය ලක්ෂ අනූපන් දහස් නමසිය අනූ අටයි ශත තිස් තුනක (රු. 2,695,998.33) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.11.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.06.28 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ මීගමුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ඒත්තුකාල් අංක 73 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඒත්තුකාල් ග්‍රාමයේ පිහිටි ''දවටගහවත්ත, බදුල්ලගහකුඹුර නොහොත් කිරිල්ලගහකුඹුර, කහගහවත්ත, කසතමරත්තඩිතෝට්ටම් සහ පුන්නමරතඩිතෝට්ටම්'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. එම්. ජී. ඩයස් යන අය විසින් සාදන ලද 2007 මැයි 28 දාතම හා අංක 4017A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ඇළ නමුත් ටෝ පාත් ( Tow Path) (වඩා නිවැරදිව), දකුණට : අංක 4017 A දරන එකී පිඹුරේ ලොට් 1B සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4017 A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 128/106 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-464/2

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

කේ. ඩී. පී. පෙරේරා සහ ආර්. ටී. ඩබ්ලිව්. ජේ. එම්. ආර්. එන්. පී. එල්. බී. ඩී. විජයරත්න.
ගිණුම් අංක : 0021 5004 4866.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් නමකෝටි හැත්තෑ හත් ලක්ෂ අසූ දහස් විසි දෙකයි ශත අටක (රු. 97,780,022.08) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 3100 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම කෝටි දෙලක්ෂ පනස් තුන්දහස් නමසිය අසූ හතරයි ශත විසි තුනක (රු. 90,253,984.23) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate (Quarterly) + Four Per centum (4%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.11.18 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.06.30 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, උතුරු කනාදර කෝරළේ (සුළු කොට්ඨාසය) නුවරගම් පළාත (නැගෙනහිර) ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ අනුරාධපුර මහ නගර සභා සීමාවන් තුළ 01 අදියර අංක 249 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අනුරාධපුරය පිහිටි ''ඇළබොඩ කැලේ'' යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද පත්ඉරු අංක 81 (අතිරේක අංක 01) හි අංක 02 දරන අවසන් නාගරික සැළසුමේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 342 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : FVP 523හි ලොට් 341 සහ 61, නැගෙනහිරට : FVP 523හි ලොට් 61 සහ ලොට් 1071 සහ 818, දකුණට : ලොට් 818, 837 සහ 343 හා බස්නාහිරට : ලොට් 837, 343 සහ 341 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම තුනයි නමයයි හතරයි එකක් (හෙක්ටෙයාර් 0.3941) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක අ. 02 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D26/105 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-464/3

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - හොරණ ශාඛාව**

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වාසියට ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදනය කරන ලද ස්ථාවර ණය ආපසු ගෙවීමට සුරක්ෂිතයක් වශයෙන්, හොරණ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එෆ්. කේ. එන්. කන්නන්ගර විසින් හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. හි වාසියට ලියා සහතික කරන ලද අංක 5620 හා 2016.01.21 වැනි දින දරන බැඳුම්කරය මගින් ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ උඩගම ලියනගේ උපුල් ශාන්ත, ඉහත කී ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නියම හිමිකරු මෙන්ම, එය පාලනය කරන පුද්ගලයා වන අතර, තව ද, ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ඉහත කී උඩගම ලියනගේ උපුල් ශාන්ත එකී සමාගමේ පාලනය සහ කළමණාකාරිත්වය දරන අතර ඒ අනුව හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. විසින් ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදන කරන ලද මූල්‍ය පහසුකම් සත්‍ය ප්‍රතිලාභියා උඩගම ලියනගේ උපුල් ශාන්ත වේ. ශාන්ත හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ උඩගම ලියනගේ උපුල් ශාන්ත විසින් පැහැර හැර ඇති බැවින් සහ බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපළ,

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2021 ජූනි මස 21 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගඟබඩ පත්තුවේ පස්දුන් කෝරලේ ගඟබඩ පත්තුවේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත 821 ඩී එගල්ඔය ග්‍රාම නිලධාරි වසම තුළ බුලත්සිංහල ගමේ පිහිටි ''කනනේගොඩැල්ල'' නමැති ඉඩම බලයලත් මිනින්දෝරු සේනක විතාරගේ විසින් සාදන ලද අංක 5840 හා 2014.06.27 වැනි දින දරන පිඹුරේ ලොට් ''ඒ'' දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හතක් වූ (අ. 0, රූ. 0, පර්. 4.7) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළුව සියලු දේ ද වේ.

*වැඩි විස්තර සඳහා* .- 2019.11.22 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2019.11.25 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - හොරණ නගරයේ සිට බැල්ලපිටිය හන්දිය දක්වා අගුරුවාතොට මාර්ගයේ කි. මී. 03 ක දුරක් පැමිණ (කි. මී. 3 කණුව දක්වා) කලවැල්ල මාර්ගයේ දෙසට වමට හැරී එගල්ඔය හන්දිය දක්වා කි. මී. 15 ක පමණ ප්‍රමාණයක් ඉදිරියට යන්න. වට්නාකම දක්වා ඇති දේපළ මෙම මාර්ගයෙ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 011 - 2661866, 011 - 2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම).

නො. 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011- 2053286/072 3207533
076 9217329/072 0881044

05-476